Nations TrustBank

# මූලික කරුණු අන්තර්ගත ලේඛනය – පාරිභෝගික ණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන මාලාවක් සකස් කර ඇති අතර, ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ. නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙතින් ලබාගත හැකි පාරිභෝගික ණය පහසුකම් සහ සේවාවන් පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ. කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිමය සහ ක්‍රියාපටිපාටිවල සිදුවන වෙනස්කම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

**විස්තරය : නේෂන්ස් පාරිභෝගික ණය**

ණය ලබාගැනීම කළ හැකි අනුපාතික වර්ග

| අනුපාතික වර්ගය | අනුපාතික ප්‍රතිශෝධනය වන කාලසීමාව |
|---|---|
| මාස 1 ක විචල්‍ය අනුපාතිකය | මාස 3 |
| මාස 6 ක විචල්‍ය අනුපාතිකය | මාස 6 |
| මාස 12 ක විචල්‍ය අනුපාතිකය | මාස 12 |
| වසර 5 ක ස්ථාවර අනුපාතිකය | තවදුරටත් පවතින යම් ණය ආපසු ගෙවීමේ කාල සීමාවක් ඇත්නම් පමණක්, අනුපාතිකය වසර 5කට පසුව ප්‍රතිශෝධනය කෙරේ. |

*අනුපාතිකය ප්‍රතිශෝධනය කිරීම, පොලී අනුපාත මත බැංකුවේ තීරණයට යටත්ව සිදුවේ.

**වාරික මනාපය**

| මනාපය | විස්තරය |
|---|---|
| ස්ථාවර වාරික මුදල, ස්ථාවර කාල සීමාව | ණය මුදල, ස්ථාවර අනුපාතිකයකට ලබාගන්නා විටක මෙම මනාපය තිබේ. වාරික වටිනාකම හෝ පොලී අනුපාතය වසර 5 ක උපරිම කාලසීමාවක් සඳහා වෙනස් නොවනු ඇත. |
| ස්ථාවර වාරික මුදල, විචල්‍ය කාල සීමාව | මෙම මනාපය විචල්‍ය අනුපාතිකය යටතේ වන ණය සඳහා තිබේ. වාරික වටිනාකම පොලී අනුපාතයේ වෙනස්වීම් සමඟ වෙනස් නොවන අතර, පාරිභෝගිකයන්ට සිය මාසික මුදල් ප්‍රවාහය පවත්වා ගනිමින් ම සමාන වාරික ගෙවීමේ පහසුව භුක්ති විඳීමට හැකිය. ණය ආපසු ගෙවීමේ කාල විස්තරය, පොලී අනුපාතයේ උච්චාවචනය මත ඉහළයාම හෝ පහළයාම සිදුවනු ලැබේ.<br>පාරිභෝගිකයා විසින් සිය වාරික මනාපය සඳහන් නොකරන විටක දී, යම් කවරම වු වැඩිමනත් සත්‍යායනයකින් හෝ ඉල්ලීම්වලින් තොරව පාරිභෝගිකයාට ඉහත කී මනාපය පිරිනමනු ලැබේ. |
| විචල්‍ය වාරික මුදල, ස්ථාවර කාල සීමාව | මෙම මනාපය විචල්‍ය අනුපාතික යටතේ වන ණය සඳහා තිබේ. වාරික වටිනාකම පොලී අනුපාතයෙහි වෙනස්කම් සමඟ වෙනස් වන අතර, ණය ආපසු ගෙවීමේ කාල විස්තරය එලෙසම පවතිනු ඇත. |

*නිවාස හා රථවාහන ණය සඳහා ස්ථාවර ණය ආපසු ගෙවීමේ කාල සීමාවක් සහිත මනාපයන් පමණක් තිබේ.

**ණය ආපසු ගෙවීමේ ක්‍රමවේදය**

ස්ථාවර උපදෙස් ලබාදීම ද තවත් එක් මනාපයක් වුව ද, ණය ආපසු ගෙවීමේ වඩාත් දිරිගන්වනසුලු ක්‍රමය වන්නේ වැටුප බැංකුවට ප්‍රේෂණය කිරීමයි. පාරිභෝගිකයා විසින් "Nations Salary Saver" පහසුකම වෙත ප්‍රවේශ වීම හෝ වැටුප බැංකුවට ප්‍රේෂණය කිරීමට යටත්ව අදාළ ණය මුදල අනුමත කරන විටක දී, ණය මුදලේ කල්පිරීමේ දිනය තෙක් වැටුප බැංකුවට ප්‍රේෂණය කිරීම අනිවාර්ය වේ.

**පාරිභෝගිකයාගෙන් අයකරන ගාස්තු/අයකිරීම් පොලිය**

<table>
<tr><th>ගාස්තු වර්ගය</th><th>විස්තරය</th><th>අයබදු</th></tr>
<tr><td>ණය සැකසුම් ගාස්තු</td><td>ණය මුදල සැකසුම් කරන අවස්ථාවේදීම අයකරනු ලබන ගාස්තුව. ණය මුදලේ වටිනාකම මත සහ කඩිනමින් ණය මුදල සකස් කිරීම සඳහා වන මනාප – ග්‍රීන් චැනල් (වැඩකරන දින 2ක් ඇතුලත) හෝ ෆාස්ට් ට්‍රැක් ණය මුදාහැරීම පැය 24ක් තුල (සෙනසුරාදා, ඉරිදා සහ බැංකු නිවාඩු දිනයන් හැර) පාරිභෝගිකයා විසින් තෝරාගන්නේ නම්, ඒ මත අයකිරීම රඳා පවතිනු ඇත.</td><td>
<table>
<tr><th>නව/ පිරවුම් ණය</th><th>පුද්ගල</th><th>රථවාහන</th><th>පුද්ගල/රථවාහන–ග්‍රීන් චැනල්</th><th>පුද්ගල/රථවාහන–ෆාස්ට් ට්‍රැක්</th></tr>
<tr><td>මිලියන 1 අඩු</td><td>රු. 8,500</td><td>රු. 8,500</td><td>රු. 13,000</td><td>රු. 20,000</td></tr>
<tr><td>මිලියන 1 – මිලියන 3</td><td>රු. 11,000</td><td>රු. 11,000</td><td>රු. 13,000</td><td>රු. 20,000</td></tr>
<tr><td>මිලියන 3 සහ ඊට වැඩි</td><td>රු. 12,500</td><td>රු. 12,500</td><td>රු. 15,000</td><td>රු. 20,000</td></tr>
<tr><td colspan="5">"ප්‍රයිවෙට් බෑන්කින්" ගනුදෙනුකරුවන් සඳහා සැකසුම් ගාස්තුවලින් 25%ක අඩුකිරීමක්<br>"ඉනර් සර්කල්" ගනුදෙනුකරුවන් සඳහා සැකසුම් ගාස්තුවලින් 10%ක අඩුකිරීමක්– වැටුප නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට බැර කළ ගනුදෙනුකරුවන් සඳහා පමණයි<br>(ග්‍රීන් චැනල් සහ පැය 24 ෆාස්ට් ට්‍රැක් ණය මුදාහැරීම හැර)<br>පවතින ණය මුදල මත අයදුම් කරන වැඩිපුර ණය අයදුම්පත ප්‍රතික්ෂේප වුවහොත් රු.1000 මුදලක් අයකරනු ලැබේ.</td></tr>
<tr><td colspan="2">නිවාස ණය</td><td colspan="3"></td></tr>
<tr><td colspan="2">අයදුම්පත් ගාස්තු</td><td colspan="3">රු. 5,000</td></tr>
<tr><td colspan="2">බැංකු ගාස්තු</td><td colspan="3">ණය සැකසීමේ බැංකු ගාස්තු සහ නීති ගාස්තු ණය මුදලේ වටිනාකම පදනම් කරගෙන අයකරනු ලැබේ.<br>නීති ගාස්තු 8% ක වැට් බද්දට යටත් වේ.</td></tr>
</table>
</td></tr>
<tr><td>ණය අර්ධ/ සම්පූර්ණ ලෙස කලින් ගෙවා පියවීම් ගාස්තුව</td><td>පුද්ගලික සහ රථවාහන : ණය අර්ධ ලෙස හෝ සම්පූර්ණ ලෙස කලින් ගෙවා පියවා දැමීමට මාස 12 කට වරක් සහ ඊට පසුව පමණක් ඉඩදෙනු ලැබේ.<br>නිවාස : ණය අර්ධ ලෙස හෝ සම්පූර්ණ ලෙස කලින් ගෙවා පියවා දැමීමට මාස 36කට පසුව පමණක් ඉඩදෙනු ලැබේ.<br>මුල් මුදල ගෙවා පියවා දැමීම මත දණ්ඩන ගාස්තුවක් අයකරනු ලැබේ.</td><td>මුල් මුදල ගෙවා පියවා දැමීම 5% දණ්ඩන ගාස්තුවකට යටත් වේ.<br>අවම ගාස්තු – පුද්ගලික සහ නිවාස රු. 10,000<br>වාහන රු. 20,000<br>(5% හෝ අවම ගාස්තු යන දෙකෙන් ඉහළ අගය අදාළ කරගනු ලැබේ)</td></tr>
<tr><td>දණ්ඩන පොලිය</td><td>හිඟ ගෙවීම් ලෙස තිබෙන වටිනාකම ගෙවා පියවා දමන තුරු හිඟ ගෙවීම් ලෙස තිබෙන වටිනාකම සඳහා සාමාන්‍ය පොලී අනුපාතය ඉක්මවන දණ්ඩන පොලියක් අයකරනු ලැබේ. මුල් හිඟ මුදල මත එකඟ වූ ණය පොලී අනුපාතයක් අයකරනු ලැබේ. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 ජුලි මස 26 වන දින නිකුත් කරන ලද යොමු අංක 02/17/600/002/001 දරන නියමයට අනුකූල වේ.</td><td>වාර්ෂික පොළී අනුපාතිකය 2% කි</td></tr>
<tr><td>ප්‍රමාද ගාස්තු</td><td>එකඟ වූ පරිදි, ණය වාරික ගෙවීමට නියමිත දිනට ණය වාරික ගෙවීම පිණිස ඇති ආපසු ණය ගෙවීමේ ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොතිබේ නම්, ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ.</td><td>රු.900</td></tr>
<tr><td>ප්‍රතිව්‍යුහගත කිරීමේ/ප්‍රති උපලේඛනගත කිරීමේ හෝ ණය ආපසු ගෙවීමේ නියමිත දින වෙනස් කිරීමේ ගාස්තු</td><td>ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ප්‍රති උපලේඛනගත කිරීම හෝ ණය ආපසු ගෙවීමේ නියමිත දින වෙනස් කිරීම සඳහා කරන ඉල්ලීම් වෙනුවෙන් මෙහෙයුම් ගාස්තුවක් වශයෙන් ඒකාකාර ගාස්තුවක් අයකරනු ලැබේ.<br>ණය පොලී අනුපාතය විචල්‍ය අනුපාතිකයක සිට ස්ථාවර අනුපාතිකයක් දක්වා පරිවර්තනය කිරීම සඳහා කරන ඉල්ලීම් වෙනුවෙන් සම්මත ප්‍රතිව්‍යුහගත ගාස්තුවක් අයකරනු ලැබේ.<br>ණය පොලී අනුපාතය ස්ථාවර අනුපාතිකයක සිට විචල්‍ය අනුපාතිකයක් දක්වා පරිවර්තනය කිරීම සඳහා කරන ඉල්ලීම් වෙනුවෙන් සම්මත ප්‍රතිව්‍යුහගත ගාස්තුවක් සහ දණ්ඩන ගාස්තුවක් අයකරනු ලැබේ.</td><td>ප්‍රතිව්‍යුහගත කිරීමේ/ප්‍රති උපලේඛනගත කිරීමේ හෝ ණය ආපසු ගෙවීමේ නියමිත දින වෙනස් කිරීමේ ගාස්තු – රු.1,500<br><br>ස්ථාවර අනුපාතිකයක සිට විචල්‍ය අනුපාතිකයකට වෙනස් කිරීම.<br><br>ප්‍රතිව්‍යුහගත කිරීමේ ගාස්තුව + දණ්ඩන ගාස්තුව 2.5% ක හෝ අවම ගාස්තුව රු. 5.000 (වැඩි අගය අදාල කරගනු ලැබේ)</td></tr>
<tr><td>ශේෂ තහවුරු නිකුතු ගාස්තුව</td><td>ශේෂ තහවුරු ලිපි නිකුතුව මෙහෙයුම් ගාස්තුවකට යටත් වනු ලැබේ.</td><td>රු. 1000</td></tr>
<tr><td>පහසුකම් නඩත්තු කිරීමේ ගාස්තු</td><td>ඔබේ ණය සඳහා අදාල බැංකුවේ ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සපයන සේවාවන් සඳහා.</td><td>රු.250/– (වාර්ෂිකව)</td></tr>
</table>

## බැංකු පහසුකම් /සේවාවන් ලබාගැනීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය

| | |
|---|---|
| යෝග්‍යතාව | පුද්ගලික/රථවාහන ණය<br>* ශ්‍රී ලංකාවේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්<br>* වයස අවුරුදු 18–55 අතර විය යුතුය<br><br>නිවාස ණය<br>* ශ්‍රී ලංකාවේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්<br>* අනේවාසික ශ්‍රී ලාංකිකයන්<br>* වයස අවුරුදු 21 – 55 අතර විය යුතුය |
| අවශ්‍ය වන ලේඛන | වැටුප් ලබන්නන් සඳහා<br>* නිසි පරිදි සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත<br>* ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්<br>* මෑතක දී ලබාගත් වැටුප් විස්තරයක්<br>* වැටුප සහ සේවා නියුක්තිය තහවුරු කරමින් සේවා යෝජකයාගෙන් ලබාගත් ලිපිය<br>* බිල්පත් තහවුරුවක් (දුරකථන/ජල හෝ විදුලි බිල්පතක්)<br>* පසුගිය මාස 6 තුළ වැටුප බැංකුවට ප්‍රේෂණය කිරීම පිළිබඳ බැංකු ප්‍රකාශ (අවශ්‍ය වන්නේ නම් පමණක්)<br><br>ස්වයං රැකියාවක නිරතවන්නන් සඳහා<br>* නිසි පරිදි සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත<br>* ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්<br>* ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය/සංස්ථාගත කිරීමේ සහතිකය<br>* පසුගිය මාස 06 සඳහා පුද්ගලික ජංගම ගිණුම් ප්‍රකාශ<br><br>නිවාස ණය සඳහා දේපළ ලේඛන අවශ්‍ය කෙරේ.<br><br>ණය තක්සේරු කිරීම තහවුරු කිරීම පිණිස බැංකුව විසින් අවශ්‍ය වන්නේ නම් අතිරේක ලේඛන ඉල්ලා සිටිනු ලැබේ.<br><br>පාරිභෝගිකයා විසින් බැංකුව සමඟ ණය ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි සඳහන් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතුය. |
| ණය ඉල්ලුම් කරන ආකාරය | 1. අපගේ බැංකුවේ ඕනෑම ශාඛාවකින් අයදුම්පතක් ලබාගැනීම.<br>2. සම්පූර්ණ කරන ලද අයදුම් පත, අවශ්‍ය ලේඛන සමඟ ආසන්නතම නේෂන්ස් ට්‍රස්ට් බැංකු ශාඛාව වෙත ඉදිරිපත් කිරීම.<br>3. පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ අංක 0114 711 411 දරන ක්ෂණික පාරිභෝගික සේවා දුරකථනය ඔස්සේ ඇමතීම් සිදුකර, බැංකු සංවර්ධන නිලධාරියෙකුගේ සහාය ලබාගැනීම. |

## වැදගත් කොන්දේසි

| | |
|---|---|
| ණය ආපසු ගෙවීමේ කාල විස්තරය | ණය ගිවිසුමක දී ණය ආපසු ගෙවීමට ඉඩදෙන කාලසීමාව වනාහී ණය ආපසු ගෙවීමේ කාල විස්තරය වේ. මෙය පාරිභෝගිකයාගේ යෝග්‍යතාව සහ ණය පහසුකමේ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව පාරිභෝගිකයා විසින් තීරණය කරනු ලැබිය හැකිය. |
| ණය ගිණුම | ණය ගිවිසුම ක්‍රියාත්මක වන ණය ගිණුම් අංකය වේ. |
| ණය ආපසු ගෙවීමේ ගිණුම | ඉතිරි කිරීමේ ගිණුමක් විය යුතු අතර එකඟ වී ඇති පරිදි, ණය ගෙවිය යුතු වන දිනට හෝ එදිනට පෙර ණය ආපසු ගෙවීම පිණිස ගිණුමේ අරමුදල් තිබිය යුතුය. |
| බැංකුවේ අභිමතය | ණය අනුමත කිරීම බැංකුවේ ණය ප්‍රතිපත්තියට යටත් විය යුතු වන අතර, එවැනි තීරණයක දී බැංකුවට තනි අභිමතයක් තිබේ. |
| ණය ආපසු ගෙවීමේ අනුපාතිකය | පාරිභෝගිකයකුගේ ශුද්ධ ආදායමට සාපේක්ෂව, ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ වන සමස්ත මාසික ණය බැඳීම් වේ. ණය පියවීම හා සම්බන්ධ පාරිභෝගිකයාට තිබෙන ආසන්නතම හැකියාව නිශ්චය කිරීමට මෙය ගෝලීය වශයෙන් භාවිත කරන දර්ශකයක් වේ.<br><br>බැංකුවෙන් පරිබාහිරව යම් කවරම වූ අලුත් ණය ලබාගැනීමට පෙරාතුව, පාරිභෝගිකයා විසින් බැංකුව දැනුවත් කළයුතු අතර, මෙම ගිවිසුමේ යම් කවරම වූ කඩකිරීමක් නිසා බැංකුවේ අභිමතය පරිදි ණය පහසුකම ඉවත් කරගැනීමට හෝ ආපසු කැඳවීමට බැංකුවට අයිතිය පිරිනමනු ලැබේ. |
| වටිනාකමට අනුකූලව ණය ප්‍රදානය | මිල දී ගැනීම කරන වත්කම්වල වටිනාකමට සාපේක්ෂව අනුමත ණය වටිනාකමේ අනුපාතිකය මෙයින් පිළිඹිබු කෙරේ. |
| ණය ඒකාබද්ධ කිරීම | විවිධ ණය පහසුකම් එක් ණය පහසුකමකට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියයි. යම් වෙනත් ආයතනයක් සමඟ තිබෙන යම් වෙනත් ණය පහසුකමක් පියවා දැමීමට පාරිභෝගිකයා අපේක්ෂා කරන්නේ නම් ණය ගෙවා පියවා දැමීම සඳහා අදාළ වන ලේඛන කිසිදු පැහැර හැරීමකින් තොරව බැංකුවට සැපයිය යුතුය. එසේ කිරීම පැහැර හරින විටක දී, ණය ගෙවා පියවා දැමීමේ ප්‍රමාදයන් නිසා පාරිභෝගිකයාගෙන් අතිරේක පොලී අයකිරීමට හේතු වේ. |
| අනියම් දින පොලිය | පළමුවන ණය ආපසු ගෙවීම, ණය මුදල ප්‍රදානය කළ දින සිට මාස 1 කට වඩා අඩු කාලයක දී කළ යුතු වන විටක දී, පොලිය පමණක් අයකරනු ලැබේ. ඊළඟ වාරිකය ගෙවිය යුතු දිනයේ සිට 1 වන සම්පූර්ණ වාරිකය මත අයකරනු ලැබේ. |
| ණය මුදල ආපසු ගෙවීමේ නියමිත දිනය | ණය මුදල ආපසු ගෙවීමේ දිනය එක් එක් මාසයේ 1 වන දින සිට 26 වන දින දක්වා අතර විය යුතු වන අතර, එය වැටුප් ලබන පාරිභෝගිකයන් සම්බන්ධයෙන් වැටුප් ගෙවන දිනය හෝ වැටුප් ගෙවන දිනයට තවත් එක් දිනක් ගතවන දිනය විය යුතුය. වැටුප් ගෙවන දිනය 26 වන දින හෝ ඊට පසුව දිනයක් වන විටක දී, ණය මුදල ආපසු ගෙවීමේ නියමිත දිනය මාසයේ 1 වන දිනය වශයෙන් තෝරා ගත යුතුය. |
| ණය පහසුකම සමාලෝචනය කිරීම | බැංකුව විසින් යම් කවරම වූ ණය පහසුකමක් කලින් කලට සමාලෝචනය කරනු ලබන අතර, පාරිභෝගිකයාට කලින් දැනුම්දීමකින් තොරව බැංකුව විසින් සිය තනි සහ පරම අභිමතය ප්‍රකාරව එකී බැංකු පහසුකම ඉවත් කරගැනීම/අවලංගු කිරීම හෝ ආපසු කැඳවීම හෝ ණය ගිවිසුම හා සම්බන්ධ නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම සිදුකරනු ලැබේ. |
| ණය පහසුකම ප්‍රතිග්‍රහණය කිරීම | ණය මුදල ප්‍රදානය කළ සැනින් ඊට අදාල පොලී අනුපාතය හෝ වෙනත් යම් කොන්දේසියක් සම්බන්ධයෙන් පාරිභෝගිකයා එකඟ නොවන විටක දී, ණය මුදල ප්‍රතිග්‍රහණය කිරීමට නොහැකිවීම පිළිබඳව පාරිභෝගිකයා විසින් වහාම (යම් කවරම විටක දී වුව ද දින 07 කට වඩා ප්‍රමාද නොවන කාලයක දී) බැංකුවට ඒ බව දැනුම්දීම කළයුතු අතර, ණය මුදලේ ලත්මුදල් උපයෝගී කරගැනීම නොකළ යුතුය. |
| ණය ආපසු අයකර ගැනීම | ණය මුදල ආපසු ගෙවිය යුතු වන නියමිත දිනට ණය ආපසු ගෙවීමේ ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොතිබේ නම් ණය මුදල ආපසු ගෙවීම හිඟ තැබීමක් වන අතර ඒ අනුව එය ණය පැහැර හැරීමේ ගිණුමක් වශයෙන් වාර්තා කරනු ලැබේ.<br><br>ණය පැහැර හැරීමේ පළමු මාස 03 ක කාලසීමාව තුළ දී ණය ආපසු ගෙවීම පිණිස සිහි කැඳවීම් ලිපි, දුරකථන ඇමතුම්, කෙටි පණිවුඩ යොමු කරන අතර, අවශ්‍ය වුවහොත් පාරිභෝගිකයා වෙත පැමිණීම ද සිදු කෙරේ, තව ද, පාරිභෝගිකයා සමඟ ඇමතීම් තහවුරු කරගැනීමට බැංකුව අපොහොසත් වුවහොත් පාරිභෝගිකයා විසින් පෙර අවස්ථාවක නිර්දේශ කරන ලද තැනැත්තන් ඇමතීමට කටයුතු කෙරේ.<br><br>පැහැර හැරීම සිව් වන මාසය දක්වා දීර්ඝ වනු ලැබුවහොත් හිඟ මුදල් අයකර ගැනීම පිණිස බැංකුව විසින් තෙවන පාර්ශවයක ණය රැස්කිරීමේ ඒජන්තවරුන් පත්කරනු ලැබිය හැකි අතර, එවැනි රැස්කිරීමක දී දරන පිරිවැය පාරිභෝගිකයාගෙන් අයකරනු ලැබේ. පාරිභෝගිකයාට යම් කවරම වූ දැන්වීමක් ලබාදීමකින් තොරව අයිරා පහසුකමක් ඇතිකිරීම හෝ පවත්නා අයිරා පහසුකම් සීමාව වැඩිකිරීම මගින් පවා යම් ණය මුදලක් යටතේ හෝ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම මුදල් සඳහා සහ ඒ මත ගෙවිය යුතු පොලිය සඳහා එකඟ වූ පරිදි නියමිත දිනට, බැංකුව සමඟ පවත්වාගෙන යන යම් කවරම වූ ජංගම ඉතිරිකිරීමේ ගිණුම් හෝ ස්ථාවර තැන්පතු ගිණුම්, හර කිරීමට බැංකුවට බලය පවරනු ලැබේ. |

මෙම ලේඛනය විශ්වීය මැන්ඩේට් පත්‍රයේ සඳහන් නියමයන් සහ කොන්දේසි හෝ පාරිභෝගික ණය අයදුම් පත් ආකෘතිය වෙනුවට භාවිත වීමක් නොවන අතර, ඉහත සඳහන් කළ ගාස්තු සහ අයකිරීම් වෙනස්වීමට යටත් වේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් පහත සඳහන් ආකාරයට අප අමතන්න.

දුරකථනය : කරුණාකර පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ අංක 0114 711 411 දරන ක්ෂණික පාරිභෝගික සේවා දුරකථනය ඔස්සේ අප අමතන්න.

විද්‍යුත් තැපෑල : customerservice@nationstrust.com

වෙබ් අඩවිය : www.nationstrust.com

ලිපි : පැමිණිලි විසඳුම් නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

ඔබගේ ඕනෑම පාරිභෝගික ණය ගිණුම් සම්බන්ධයෙන් වන යම් කවරම වූ පැමිණිලි ඔබට ඇත්නම්, එම පැමිණිලි පිළිබඳව සඳහන් කරමින් කෙටි ලිඛිත ප්‍රකාශයක් ඉහත ලිපිනයට යොමු කරන්න. නොඑසේ නම්, ඉහත දක්වා ඇති දුරකථන ඇමතීමෙන් අප වෙත දැනුම් දෙන්න. අප විසින් වැඩ කරන දින 03 ක් ඇතුළත ඔබට ප්‍රතිචාර දක්වනු ලැබේ.